# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2164/21 – 2020 පෙබරවාරි 26 වැනි බදාදා – 2020.02.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 09 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/17/2019/D/23.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: LAN/ACQUT/01/01-01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 19 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, කෝරළයිපත්තු උතුර, වාකරයි.

2. **ඉඩමේ විස්තරය.–** නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 212 මධ්‍යම වහරෙයි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වහරෙයි ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක BT/KPN/2019/131 හා 2019.07.10 වන දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මුහත්තුවර පූමි – ප්‍රමාණය: හෙක්. 0.4047**
උතුරට: එස්. ආම්ස්ට්‍රෝන් හිමිකම් කියන මුහත්තුවර පූමි ගෙවත්ත සහ මුහුද; නැගෙනහිරට: මුහුද සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි මුහත්තුවර පූමි ගෙවත්ත; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මුහත්තුවර පූමි ගෙවත්ත සහ පනිච්චන්කේනි ආරු; බටහිරට: පනිච්චන්කේනි ආරු සහ එස්. ආම්ස්ට්‍රෝන් හිමිකම් කියන මුහත්තුවර පූමි ගෙවත්ත.

03 – 419